**ශීර්ෂය 228 - අධිකරණ පරිපාලනය**

**----------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

අධිකරණ පරිපාලනයේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරවඅධිකරණ පරිපාලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව2022 ජූනි20 දිනප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරවඅධිකරණ පරිපාලනයටඅදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරිවෙත නිකුත් කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනටඅධිකරණ පරිපාලනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍යප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරවඅධිකරණ පරිපාලනයවිසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරවඅධිකරණ පරිපාලනයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධානගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය එලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍යප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේසහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අවසාන ශේෂයන් සමාලෝචිතවර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස ගැනීමේ දී වත්කම් ශේෂ 07 ක එකතු වටිනාකම රු.371,301,551 කින් සැසඳී නොතිබුණි. | මෙම වෙනසට හේතු වී ඇත්තේ සමාලෝචිත වර්ෂයේ තක්සේරු කරන ලද වත්කම් වල වටිනාකම් ආරම්භක ශේෂ ලෙස ඇතුලත් කිරීමත්, ප්‍රධාන කාර්යාලය විසින් මිලදී ගෙන අධිකරණ වෙත නිකුත් කරනු ලබන වත්කම් ප්‍රධාන කාර්යාලයේ සිගාස් වැඩසටහනෙන් ඉවත් කර අදාල මහාධිකරණයේ ආරම්භක ශේෂ ලෙස සිගාස් වැඩ සටහනට ඇතුළත් කිරීමත්ය. | ඉකුත් වර්ෂයේ වත්කම්වල අවසාන ශේෂයන්, සමාලෝචිතවර්ෂයේ ආරම්භක ශේෂයන් සමඟ සැසඳී තිබිය යුතුවේ. |
| (ii) | අධිකරණ කලාප විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ උපලේඛන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට යන්ත්‍ර හා උපකරණවල එකතු ශේෂය රු. 457,321,708 කින් සහ සමාලෝචිත වර්ෂයේ එහි මිලදී ගැනීම් රු. 23,567,420 කින් , මූල්‍ය ප්‍රකාශනවල අගයන් සමඟ නොසැසඳුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව BOS වාර්තාව අනුව වූ ස්ථාවර වත්කම් ලේඛනය මූල්‍ය ප්‍රකාශන තුලට ඇතුලත් කර ඇත.CIGAS වැඩ සටහනට අනුවවූ මහාධිකරණ වාර්තා හා BOSවර්තාව අනුව වූ ස්ථාවර වත්කම් ලේඛනය අතර වෙනසක් දක්නට නොලැබේ. | BOS වාර්තාව සහ අධිකරණ කලාපවල ස්ථාවර වත්කම් ලේඛණ සසඳා ශේෂ නිවැරදි කරගත යුතු වේ. |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව සහ දෙපාර්තමේන්තු පාලන ගිණුම අතරපැවති රු.12,225,070 ක වෙනස සඳහා හේතු ඉදිරිපත් කර නොතිබුණි | මෙම වෙනස වර්ෂ ගණනාවක සිට පැවත එන අතර, අධිකරණ මඟින් නිවැරදි ණය ශේෂයන් පොත් වල සටහන් නොකිරීම සහ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් යටතේ ණය ශේෂ නිරවුල් කිරීමේදී මෙම දෝෂය ඇතිවී ඇත. | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව, දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂයට සමාන වියයුතුවේ. |

(ඇ) **වානිජ නොවන අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආණමඩුව හා හලාවත මහේස්ත්‍රාත් අධිකරණ නිල නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති 02 ට අදාලව 2021.12.31 දිනට තවදුරටත් අය කර ගත යුතු කුලී හා වැඩ අත්තිකාරම් ශේෂය වූ රු.6,264,535 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත්කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ එම අත්තිකාරම් ගිණුම් ශේෂය සහ කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ශේෂය රු.6,264,535 ක් අඩුවෙන් දක්වා තිබුණි. | උක්ත ව්‍යාපෘති සඳහාලබා දී තිබූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සඳහා සංචිත ගිණුම් ආරම්භ කර නොමැති බැවින් මෙම අත්තිකාරම් අය කර ගැනීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර නොමැත. එසේ වුවද ගෙවන ලද අත්තිකාරම් මුදල, බිල්පත් ගෙවීමේදී නියමිත පරිදි අය කරනු ලබන අතර 2021.12.31 දිනට අය විය යුතු අත්තිකාරම් මුදල ACA-5(a) හි සටහනක් ලෙස ඇතුලත් කර ඇත. | 2016 අගෝස්තු 03 දිනැති අංක 250/2016 **(i)**දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව අත්තිකාරම් පිළිබඳ නිවැරදි තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු සකස් කර නොතිබීම නිසා වැය විෂයන් 8 ක් සඳහා සලසාගෙන තිබුණු රු.255,400,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනය ඉතිරි වී තිබුණි. | කොවිඩ් ව්‍යසනය හේතුවෙන් ආයතනයේ කටයුතු සැලසුම් කළ පරිදි සිදු නොවීම සහ, කොන්ත්‍රාත් ආයතනය විසින් ලියවිලි ඉදිරිපත් නොකිරීම මත අපේක්ෂිත පරිදි අවසන් බිල්පත් ගෙවීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මු.රෙ. 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙළ කළ යුතුවේ. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන වල සඳහන් බැරකම් ශේෂය සහ විගණනයට ඉදිරිපත් කර තිබූ අධිකරණ කලාපවල බැරකම් පිළිබඳ උපලේඛනවල ශේෂ (ලිපි ගොනුව) අතර රු.9,932,916 ක නොසැසඳීමක් පැවතුණි. | මහාධිකරණ කලාප වලින් එවන ලද උපලේඛනයන්හි තිබූ දෝෂයන් නිවැරදි කර සටහන් අංක IVට අගයන් ඇතුළත් කර ඇත. | අධිකරණ කලාපවල පවතින ගිණුම් ශේෂ සමග මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ගිණුම් ශේෂ නිවැරදි වියයුතුවේ. |
| (ආ) | බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය (සටහන **iii)** ට ඇතුලත් කලයුතු එකතුව රු.6,953,210 ක් වූ බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශය (සටහන **iv**) හි දක්වා තිබුණි. | බැරකම් පිළිබඳ ප්‍රකාශය (සටහන **iii**) ට ඇතුලත් කරනු ලබන්නේ සිගාස් වැඩ සටහන මඟින් වර්ෂ අවසාන දිනට බාගත කරන ලද අගයන් පමණක් එනම් ප්‍රතිපාදන පැවතියද අක්මුදල් නොමැති වීම හේතුවෙන් ගෙවීමට නොහැකි වූ බිල්පත් වේ. අධිකරණ කටයුතු පවත්වා ගෙන යාමට මෙම වියදම් දැරීම අත්‍යාවශ්‍ය වූ බැවින් සටහන් අංක **iv**හි සඳහන් බැරකම් වලට බැදීමට සිදු වී ඇත. | බැදීම් හා බැරකම් පිළිබඳ තොරතුරු මුදල් රෙගුලාසි ප්‍රකාරව සටහන **iii** හා සටහන **iv** හි නිවැරදිව ඉදිරිපත් කළ යුතුවේ. |
| (ඇ) | බැරකම් පිළිබඳ ප්‍රකාශය - **(i)** සටහන **(iv)** හි දක්වා තිබුණු එකතුව රු.26,557,266 ක් වූ බැරකම්, භාණ්ඩාගාරයේ බැදීම් හා බැරකම් පිළිබඳ වාර්තාවට **(SA 92)** ඇතුලත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල බැරකම් පිළිබඳ ප්‍රකාශය (සටහන **iii**) ට ඇතුලත් කරනු ලබන්නේ සිගාස් වැඩ සටහන මඟින් වර්ෂ අවසාන දිනට බාගත කරන ලද අගයන් පමණක් එනම් ප්‍රතිපාදන පැවතියද අක්මුදල් නොමැති වීම හේතුවෙන් ගෙවීමට නොහැකි වූ බිල්පත් වේ. අධිකරණ කටයුතු පවත්වා ගෙන යාමට මෙම වියදම් දැරීම අත්‍යාවශ්‍ය වූ බැවින් සටහන් අංක **iv**හි සඳහන් බැරකම් වලට බැදීමට සිදු වී ඇත. | වර්ෂ අවසානයේ ආයතනයේ සියළුම බැදීම් හා බැරකම් භාණ්ඩාගාරයට වාර්තා කර තිබිය යුතුවේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ | | | | | |
| (i) | XXIV වැනි පරිච්ඡේදයේ 4.2.5 වගන්තිය | 6,707,975 | විශ්‍රාම ගොස් තිබූ නිලධාරීන්ගේ ණය ශේෂ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිත මුදල්වලින් අඩුකර නොතිබුණි. | ණය ශේෂ බොහොමයක් අය කර ගැනීමට නොහැකිව ඇත්තේ විනය පරීක්ෂණ පැවතීම මත විශ්‍රාම ගොනුව යථාවත් කිරීමට ප්‍රමාද වීමත්, විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා ප්‍රතිපාදන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් නිදහස් නොකිරීමත් නිසාය. | අය නොවූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| **(ii)** | 7.2.5 වගන්තිය | **110,800** | පෙර ලබාගත් බයිසිකල් ණය සම්පූර්ණයෙන්ම අයකර ගැනීමකින් තොරව කොළඹ මහාධිකරණ කළාපයේ නිලධාරියෙකුට මෝටර් රථ ණයක් ලබාදී පසුව ඔහුගේ වැඩ තහනම් කර තිබීම නිසා ලබාගත් මෝටර් රථ ණය රු.107,000 ක් සහ බයිසිකල් ණය රු.3,800 ක් වසර 05 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පැවතුණි. | මේ සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණයෙන් විමසීම් කල අතර නිලධාරියා සම්බන්ධයෙන්කිසිදු තොරතුරක්සොයාගත නොහැකි වූ බැවින් තව දුරටත් සොයා බලා ඉදිරි කටයුතු සිදු කරන බව 2021.10.13 දිනැති අංක කො/මහාධි/ගි/අත්ති බී/2021 දරණ ලිපිය මගින් දන්වා ඇත. | අත්තිකාරම් ගෙවීමේදී හා අයකර ගැනීමේදී ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

--------------------

| | | | | | |
|---|---|---|---|---|---|
| **(i)** | මුදල් රෙගුලාසි 104 (1) | | 2001.05.13 දින රත්නපුර මහේස්ත්‍රාත් අධිකරණයේ ලී බඩු සහ සවිකිරීම් ගින්නෙන් පිලිස්සීම නිසා සිදුවතිබූ හානිය 2021 දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කර නොතිබුණි. | පිළිතුරුලබාදීනොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| **(ii)** | මුදල් රෙගුලාසි 109 (1) හා (2) | රු.2,567,467 | 2000 සිට 2020 දක්වා අවස්ථා 38 කදී සිදු වී තිබුණු අලාභ හා හානි සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වර්තමානයේ සිදුවන වාහන අනතුරු ඇතුළු අනෙකුත් අලාභ හානි සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව කටයුතු කර ගෙන යන අතර වර්ෂ ගණනාවක් පැරණි මෙම අලාභ හානි සම්බන්ධයෙන් පවතින ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට කටයුතු කර ඒ අනුව අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| **(iii)** | මුදල් රෙගුලාසි 396(ඇ) | 1,966,222 | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ප්‍රධාන කාර්යාලය සහ මහාධිකරණ කළාප 23 කට අයත් බැංකු ගිණුම් 69ක බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ චෙක්පත්සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මු.රෙ.396 අනුව කටයුතු කරන ලෙසට අදාල අධිකරණයන් වෙත උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2.4 තැන්පත් ශේෂයන්

--------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අධිකරණ කලාප 26 හි තැන්පතු ගිණුම් 582 ක රු. 13,035,216,242 ක් වූ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අධිකරණ කලාප වලට අදාලව විශාල තැන්පතු ප්‍රමාණයක් පවතින බැවින් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම ප්‍රායෝගිකව අපහසු වන වන අතර ප්‍රධාන කාර්යාලය සඳහා පමණක් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර ඇත. | තැන්පතු ගිණුම් සඳහා කාල විශ්ලේෂණයක්ඉදිරිපත් කර මුදල් රෙගුලාසි 571 ප්‍රකාරවකටයුතු කළ යුතුවේ. |
| (ආ)2017, 2018 හා 2019 වර්ෂවල කොන්ත්‍රාත් සඳහා ගෙවීම් කිරීමේ දී රඳවුම් මුදල් ලෙස ලබාගෙන තිබූ එකතුව රු.172,321,534 ක් 2022 මාර්තු වන විටත් නිරවුල් කර නොතිබුණි. | ඇතැම් ඉදිකිරීම් මේ දක්වා අවසන්ව නොමැති බැවින් ඉදි කිරීම් කටයුතු අවසන් වන තෙක් රඳවුම් මුදල් නිදහස් කළ නොහැකි අතර ඉදිකිරීම් කටයුතු අවසන් වුවද ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලැබෙනතෙක් අවසන් බිල්පත් සඳහා ගෙවීම් කළ නොහැකි වීම සහ කොන්ත්‍රාත් කරුවන් විසින් අවසන් බිල්පත් ඉදිරිපත් කර නොමැති බැවින් ද එම රුදවුම් මුදල් තැන්පත් ගිණුමේ ඉතිරිව පවතී.එසේ වුවද නිදහස් කිරීමට හැකියාව පවතින සියළු රඳවුම් මුදල් නිදහස් කිරීමටත් එසේ නොවන්නේ නම් මු.රෙ 571 ප්‍රකාරව රජයේ ආදායමට බැර කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | අවසන්ව ඇති ඉදිකිරීම්වලට අදාල රැඳවුම් මුදල ගිවිසුම් ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කල යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාහන අනතුරු ලේඛණය අනුව වාහන 26 ක එකතුව රු. 250,360 ක අලාභ කපා හැරීම් කර තිබුණත්, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය (සටහන I) හි වාහන 48 ක එකතුව රු.579,740 ක අලාභයක් කපා හැර තිබුණි. | වර්තමානයේ වාහන අනතුරු ලේඛණය යාවත්කාලීන කර අලාභ කපා හැරීම සිදු කරනු ලබන අතර වාහන අනතුරු ලේඛණයෙහි සඳහන් නොවූ වර්ෂ ගණනාවක් පැරණි වාහන අනතුරු වෙනුවෙන් වූ අලාභ හානි කපා හැරීමට කටයුතු කර ඇත. | වාහන අනතුරු ලේඛණය යාවත්කාලීන කර පවත්වා ගත යුතුවේ. |

### 3.2 කළමණාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කල්මුණේනව සිවිල් අභියාචනාධිකරණ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා වූ2017 දෙසැම්බර් 29 දිනැති ප්‍රතිග්‍රහණ ලිපිය අනුව එදින සිට දින 14 ක් ඇතුළත වැඩ ආරම්භ කළ යුතු වුවත්, දින 07 ක ප්‍රමාදයකින් පසුව 2018 ජනවාරි 19 දින වැඩ ආරම්භ කර තිබුණි. එසේම2019 ජුලි 19 දින වැඩ නිමකල යුතු වූ මෙම ව්‍යාපෘතියේ වැඩ 2019 ජුලි 15 දින නිමකර ඇතිබව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය විසින් 2019.09.22 දිනැතිව දන්වා තිබුණද ව්‍යාපෘතියේ අවසාන බිල්පත් විගණිත දිනය වූ 2021 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ - 2006 හි 5.4.8 (අ) වගන්තියට පටහැනිව කොන්ත්‍රාත් වටිනාකම පදනම් කර නොගෙන රු.584,482ක් අඩුවෙන් කොන්ත්‍රාත්තුව සඳහා කාර්යසාධන බැඳුම්කරය ලබා ගෙන තිබුණි.තවද අමාත්‍යාංශයේ ලිඛිත අවසරයකින් තොරව, අදාල විනිසුරුගේ අවශතාවය මත ඉදිකිරීම් සැලසුම් වෙනස් කර තිබුණි. | ව්‍යාපෘතිය සඳහා යෝජිත භූමියේ ගස් කපා ඉවත් කිරීම සඳහා අපේක්ෂිත කාලයට වඩා දින කිහිපයක් ගතවීම මත 2018.01.19 දින ඉදිකිරීම් ආරම්භ කර ඇත.මේවන තෙක් කොන්ත්‍රාත් ආයතනය මඟින් අවසන් බිල්පත සකස්කර ඉදිරිපත් කර නොමැත. කොන්ත්‍රාත්කරුවන් වෙත ව්‍යාපෘති පිරිනැමීමේදී නිවැරදි වටිනාකම මත පදනම්ව කාර්ය සාධන සුරක්ෂණය ලබා ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි.ඉදිකිරීම් සැලසුම් වෙනස් කිරීම සම්බන්ධව අධිකරණ විනිසුරුවරුන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත දැන්වීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති ආරම්භ කල යුතු අතර වෙනස් කරන සැලසුම් සඳහා අමාත්‍යාංශයේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතු වේ. එසේම නිවැරදි කොන්ත්‍රාත් වටිනාකම මත පදනම්ව කාර්ය සාධන සුරක්ෂණය ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**(ආ)**

| | | |
|---|---|---|
| ගාල්ල අධිකරණ සංකීර්ණය ඉදිකිරීම<br>(i)කොන්ත්‍රත්තුවේපළමු අදියර ප්‍රතිග්‍රහණ ලිපියේ සඳහන් දිනට දින 20 ක් සහ දෙවන අදියර දින 87 ක් ප්‍රමාද කර වැඩ ආරම්භ කර තිබුණි. | කොන්ත්‍රාත්තුවේ පළමු අදියර ඉදිකිරීම සඳහා වන අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ලියවිලි සම්පූර්ණ වී නොමැති බැවින්කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ ලිපිය පරිදි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වූ බව උපදේශන ආයතනය විසින් අංක CB/AGM/SP/C824 හා 2013.12.18 දිනැතිලිපිය මඟින් දන්වා ඇත.දෙවන අදියරේදී සැලසුම්වල නව සංශෝධනයන් සිදු කරන ලද අතර ඊට අනුරූපීව ප්‍රමාණ බිල්පත්‍රය සංශෝධනය කිරීම නිසා වැඩ ආරම්භ කිරීමප්‍රමාද විය. | ප්‍රතිග්‍රහණ ලිපියේ දිනයන් සංශෝධනය කර ගැනීමට කටයුතු කල යුතු වේ. |
| (ii) ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) ප්‍රකාරව සකස් කල යුතු ප්‍රසම්පාදන කාල රාමුවක්සකස් කර නොතිබුණි. | දැනට සිදු කරනු ලබන සියළු ප්‍රසම්පාදන කටයුතු වලදී ප්‍රසම්පාදන කාල රාමුව සකස් කර ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සඳහා යොමු කරනු ලැබේ. | රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **4.2.2 (අ)** ප්‍රකාරවකටයුතු කළ යුතුවේ. |
| (iii) කොන්ත්‍රාත්තුවවිධිමත්ව සැලසුම් කර නොතිබීම නිසා 2016 අගෝස්තු වන විට පළමු අදියර නැවතී තිබූ අතර, නිම කිරීමට ඉතිරිව තිබූ රු.319,083,108 ක් වූ වැඩ කොටස දෙවන අදියර ලෙස එම ආයතනයටම අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත රු.923,000,000 කට 2020 ජුනි මාසයේ දී ප්‍රදානය කර තිබීමෙන් රු.603,916,891 කින් කොන්ත්‍රාත් පිරිවැය ඉහළ යාමක් සිදුවී තිබුණි. | නොවැලැක්විය හැකි හේතු මත ඉදිකිරීම් කාලය දීර්ඝ වීම නිසා අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී ඇත. | විධිමත්සැලසුමකින් යුතුව අනුමත කාලරාමුව තුල ඉදිකිරීම් අවසන් කල යුතු අතර රජයේ මුදල් වැය කිරීමේ දී ආර්ථිකමය සහ සකසුරුවම්භාවය පිළිබඳ දැඩි සැලකිල්ලෙන් යුක්තව කටයුතු කල යුතු වේ. |
| (iv) 2016 අගෝස්තු සිට වසර 04 කට ආසන්න කාලයක් වැඩ නැවතී තිබූ ව්‍යාපෘති සඳහා එම කාලයට ආරක්ෂක, විදුලි, කම්කරු හා කාර්ය මණ්ඩල ගාස්තු ලෙස රු. 23,000,000 ක් දරා තිබුණි. | ඉදිකිරීම් කටයුතු **2016** වසරේදී නතර වීම නිසා ඒ සම්බන්ධයෙන් නිශ්චිත තීරණයකට පැමිණෙන තෙක් එහි ආරක්ෂාව සඳහා මෙම වියදම් දැරීමට සිදුවී ඇත**.** | රජයේ මුදල් යෙදවීමේ දී නිවැරදි සැලසුම්වලට අනුව කාර්යක්ෂම හා ආර්ථික භාවයෙන් යුක්තව කටයුතු කල යුතු වේ. |
| (v) රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.10.1 (ආ) ප්‍රකාරව අවම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට ලංසුව පිරිනැමීමට පෙර පශ්චාත් සුදුසුකම් පරීක්ෂා කර කොන්ත්‍රාත්තුව ඵලදායී ලෙස කරගෙන යාමට ඇති හැකියාව සම්බන්ධයෙන් පරීක්ෂා කර නොතිබීම නිසා 2014 අගෝස්තු හා සැප්තැම්බර් | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ඉදිකිරීම් සම්බන්ධ ප්‍රමුඛ පෙළේ රාජ්‍ය ආයතනයක් වන බැවින්කොන්ත්‍රාත්තුව ඵලදායී ලෙස ඉටු කිරිමට අවශ්‍ය හැකියාව සහ සම්පත් ප්‍රමාණය පිළිබඳ එවකටගැටලු සහගත තත්ත්වයන් නොතිබූ බැවින් එම ආයතනය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. | රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.10.1 (ආ) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

මාසවල නියමිත මානව සම්පත් කොන්ත්‍රාත්තුව සඳහා යොදවා නොතිබුණි.

**(ඇ)** නාරම්මල සංචාරක මහේස්ත්‍රාත් අධිකරණයේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරිමේ කොන්ත්‍රාත්තුව

| | | |
|---|---|---|
| (i)2019 දෙසැම්බර් 18 දින අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අනුමැතිය ලබාදී තිබුණ ද කොන්ත්‍රාත්තුවට අදාළ ප්‍රතිග්‍රහණ ලිපිය 2020 ජනවාරි 20 දින ලංසුකරු වෙත යවා තිබූ අතර ගිවිසුමට එළඹ තිබුණේ 2020 ජූනි 08 දින දීය. | ව්‍යාපෘතිය සඳහා යෝජිත භූමියෙහි නඩු භාණ්ඩ ගොඩගසා තිබීමත්, කොවිඩ්19 වසංගත හේතුවෙන් රට මුළුමනින්ම වසා දැමීමත් නිසා 2020.06.03 වනදින ව්‍යාපෘතිය සඳහා භූමිය පැවරීම සිදු කොට ඇති අතර 2020.06.08 දින වන විට විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමට එළැඹ ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ (2006) 8.9.1 අනුව ලංසුකරුවකු විසින් ඉදිරිපත් කරන ලද ලංසුවක් ප්‍රතිග්‍රහණය කිරීමෙන් පසු අදාල ලංසුකරු වෙත වහාම විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත්කළයුතු අතර ඒ සමඟ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතුවේ. |
| (ii) 2017 වර්ෂයේදීඉදිකිරීමටසැලසුම්කරතිබූමෙහි ඉදිකිරීමසහසැලසුම්පිළිබඳනිශ්චිතතීරණ යක්නොගැනීමනිසාප්‍රසම්පාදනකටයුතු නතරකර **2019** වර්ෂයේදීනැවතආරම්භකිරීමේදීමුළුපිරි වැයඇස්තමේන්තුවරු.2,926,984 කින්ඉහළගොස්තිබුණි**.** | ගොඩනැගිලි සැලසුම් වෙනස් වීමත් ඇස්තමේන්තුවේ ප්‍රාථමික කාර්යයන් විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කිරීමත්, 2018 ඒකක මිල ගණන් (2018 BSR Rate) අනුව ඇස්තමේන්තු සකස් කිරීමත් මුළු පිරිවැය ඇස්තමේන්තුවඉහල යාමට හේතු වී ඇත. | නිවැරදි ඇස්තමේන්තු සකස් කර ලබාගත් ප්‍රතිපාදන නියමිත කාලය තුළ අදාල කාර්යයට යෙදවිය යුතුවේ. |
| (iii)කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කර දින 270 ක් තුළදී ව්‍යාපෘතිය නිම කර නැවත භාරදීමට නියමිතව තිබූ නමුත් 2020 සැප්තැම්බර් 28 වැඩ ආරම්භ කළ ව්‍යාපෘතියේ 2021 සැප්තැම්බර් 30 දිනට භෞතික ප්‍රගතිය සියයට 33 ක් වී තිබුණි. | 2020.09.28 දින ව්‍යාපෘතියේඉදිකිරීම් කටයුතු ආරම්භ කරන අවස්ථාවේදීසිට යෝජිත භූමියෙහි පැවැති අපහසුතා(නඩු භාණ්ඩ ඉවත් කිරීම, පැවැති සීමිත ඉඩකඩක් තුළ ඉදිකිරීම් කටයුතු සිදුකිරීම, ඉදිකිරීම් ද්‍රව්‍යතැබීමට ස්ථානයක් නොමැතිවීම,භාණ්ඩ සම්පූර්ණයෙන් ඉවත්කිරීම පළමු මහලේ වැඩඅවසන් කිරීමෙන් පසු සිදු කල යුතු වීම) හා 2020 සහ 2021 වර්ෂවලදී පැවැතිකොරෝනාවසංගත තත්ත්වය නිසා සැලසුම් කල පරිදි ඉදිකිරීම් කටයුතු සිදු කිරීම අපහසු වී ඇත. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ඉදිකිරීම් කටයුතු අවසන් කර භාර දීමට කටයුතු කළ යුතුවේ**.** |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අය නොවූ ණය ශේෂ<br>(i) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ සැසඳුම් ප්‍රකාශය අනුව හිඟණය ශේෂවල එකතුව රු.29,386,794 ක් වූ අතර 2022 ජුනි 02 දිනට ඒ තුල ඇතුලත් වසර 05 කට වැඩි කාලයක් ගත වූ ණය ශේෂවල වටිනාකම රු.3,510,381 ක් විය. | මෙම ණය ශේෂයන් වසර 20 කට වඩා පැරණි ණය ශේෂයන්ය. මේවාට අදාල ණය ගොනු, පුද්ගලික ලිපින, ජාතික හැදුනුම්පත් අංක සහ ඇපකරුවන් යනාදී නිසි තොරතුරු අධිකරණ සතුව නොමැති බැවින් ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම අසීරු වී ඇත. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුවේ. |
| | (ii)මියගිය නිලධාරීන්ගෙන් 2022.04.30 දිනට අයවිය යුතු ශේෂය රු.3,212,313 ක් වූ අතර, වර්ෂය තුළ කිසිදු වාරිකයක් අය නොවූ එකතුව රු.2,182,397 ක් වූ ණය ශේෂ 16 ක් විය. | වර්ෂ ගණනාවක් සිට අය නොවී පවතින රු. 2,182,397ක ණය ශේෂ සඳහා විධිමත් තොරතුරු නොමැති වීම නිසා මරණ පාරිතෝෂිතයෙන් අයකර ගැනීම අසීරු වී ඇත. | අය නොවූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| | (iii)වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගෙන් සහ සේවය අතහැර ගොස් සිටි නිලධාරීන්ගෙන් 2022.05.30 දිනට අයවිය යුතු ණය ශේෂය පිලිවෙලින් රු.10,078,450 ක් සහ රු.4,015,309 ක් විය. | බොහෝ ණය ශේෂයන් ඉතා පැරණි වීම නිසා ණය ගොනු, පුද්ගලික ලිපින, ජාතික හැදුනුම්පත් අංක සහ ඇපකරුවන් යනාදී තොරතුරු අධිකරණ සතුව නොමැති වීම සහ වැඩ තහනම් කරන ලද නිලධාරීන්ගේ විනය කටයුතු අවසන් වී නොමැති වීම නිසා මෙම ණය ශේෂ අයකර ගැනීමට අපහසු වී ඇත. | අය නොවූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |